# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2271/24 – 2022 මාර්තු මස 15 වැනි අඟහරුවාදා – 2022.03.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2022 අංක 88 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/9/2021/BA/183.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: KES/DS/LND/AC/8/5/26.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2022 මාර්තු මස 14 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, කැස්බෑව.

2. **ඉඩමේ විස්තරය.–** බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 535A, බෙල්ලන්විල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, බෙල්ලන්තර (බොරලැස්ගමුව නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි කොළඹ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක CO/KSB/2021/574 දරන පූගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – කඳුරුගහ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.4123 ක් පමණ**

උතුරට: දෙහිවල පාරේ වරි. අංකය සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි ඉඩම, දෙහිවල පාරේ වරි. අංකය සොයාගත නොහැකි බෙල්ලන්විල රජමහා විහාරය හිමිකම් කියන ඉඩම සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි කඳුරුගහ කුඹුර; නැගෙනහිරට සහ දකුණට: හිමිකම් කියන අය සොයාගත නොහැකි කඳුරුගහ කුඹුර; බටහිරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි කඳුරුගහ කුඹුර, දෙහිවල පාරේ වරි. අංකය සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි ඉඩම, දෙහිවල පාරේ වරි. අංකය සොයාගත නොහැකි බෙල්ලන්විල රජමහා විහාරය හිමිකම් කියන ඉඩම.

EOG 03 – 0898